# වෘත්තිමය ගිණුම් ලිපිකරුවන් බඳවා ගැනීම
# ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බලකාය

ඉදුරාම ගිණුම් ලිපිකරු වෘත්තිය සඳහා (ලාන්ස් කෝප්‍රල්) නිළයෙන්
ආධුනික සෙබළුන් බඳවා ගැනීම.

**<u>මූලික සුදුසුකම් :</u>**

අවිවාහක, ශ්‍රී ලාංකික වයස අවුරුදු 18 ත් 26 ත් අතර, උස අඩි 05 අඟල් 04 නොඅඩු පිරිමි අයවළුන්ට අයදුම් කල හැක

**<u>ලාන්ස් කෝප්‍රල් නිලය සඳහා (ගිණුම් ලිපිකරුවන්)</u>**

**<u>අධ්‍යාපන සුදුසුකම් :</u>**

අපොස (උ/පෙළ) විෂයයන් දෙකකින් සමත්ව තිබිම (වාණිජ හා ගණිත අංශයෙන් සමත් අය වෙනුවෙන් විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ)

**<u>වෘත්තිය සුදුසුකම් :</u>**

- ශ්‍රී ලංකා ගණකාධිකාරි ශිල්පීය ආයතනයේ (AAT) අධියර I සමත්වීම හෝ
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව පළමුවන වසර සමත් වීම හෝ
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ව්‍යාපාර අධ්‍යන ඩිප්ලෝමාව සමත්වීම හෝ
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CASL) විසින් පවත්වනු ලබන ගිණුම්කරණය හා ව්‍යාපාර සහතික 1 (Certificate in Accounting and Business 1) හෝ පැරණි නිර්දේශය යටතේ පැවති පදනම් විභාගය (Foundation Exam) සමත්වීම හෝ
- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ජාතික ගිණුම්කරණ ශිල්පීය සහතිකපත්‍ර විභාගය සමත්වීම හෝ
- සහතිකලත් කළමණාකරණ ගණකාධිකාරී ආයතනය (CMA) විසින් පවත්වනු ලබන පදනම් විභාගය (Foundation Exam) හෝ පැරණි නිර්දේශය යටතේ පැවති තාක්ෂණ අධියර (Technical Stage) සමත්වීම සහ

ගිණුම් ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබිම, පිළිගත් ගණකාධිකරණ වෘත්තිය අධ්‍යාපන ආයතනයක් වෙතින් ගණකාධිකරණය පිළිබඳ වෘත්තිය පාඨමාලාවක් හෝ පරිගණක පෘඨමාලාවක් හදාරා තිබිම හා සිංහල/ඉංග්‍රිසි භාෂාවෙන් පරිගණකයෙන් වැඩ කිරිමේ හැකියාවක් ඇති අය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ

**<u>වැටුප් හා දීමනා :</u>**

පුහුණු කාලසිමාවේදී සියලු දිමනා සහිතව මසකට අවිවාහක ලාන්ස් කෝප්‍රල් සෙබළෙකුට රු.32,000.00 කට නොඅඩු වැටුපක් හා අවිවාහක සාමාන්‍ය සෙබළෙකුට රු.24,620.00 කට නොඅඩු වැටුපක් ද ලබාගත හැක. විවාහක ලාන්ස් කෝප්‍රල් නිලයේ සෙබළෙකුට සියලු දිමනා සහිතව මසකට රු.42,000.00 කට නොඅඩු වැටුපක් හා විවාහක සමාන්‍ය සෙබළෙකුට සියලු දිමනා සහිතව මසකට රු.39,000.00 කට නොඅඩු වැටුපක් ද ලබාගත හැක (එයට අමතරව ඉදුම්/හිටුම්, නිල ඇඳුම්, වෛද්‍ය පහසුකම් හා ප්‍රවාහන පහසුකම් නොමිලේ ලබාදෙනු ලැබේ

**<u>වෙනත් වරප්‍රසාද :</u>**

දේශිය/විදේශිය පාඨමාලා හැදෑරිමේ අවස්ථාව, විදේශ සංචාර හා හයිටි රාජකාරි සඳහා සහභාගි වීමට අවස්ථාව හිමිවේ

අයදුම්පත් පහත ආකාරයෙන් සම්පූර්ණ කර සහතිකපත් වල ඡායාස්ථ පිටපත් සමඟින් 2016.03.30 දිනට පෙර "රෙජිමේන්තු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බලකාය, යුද හමුදා ජනපදය, පනාගොඩ - හෝමාගම" යන ලිපිනයට තැපැල් කර එවිය යුතු වේ. නැතහොත් යුද හමුදා බෝධිරාජාරාමය, පනාගොඩ පවත්වනු ලබන ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බළකායේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ගෙනවිත් භාරදිය හැක.

1. සම්පූර්ණ නම : ..................................... 2. උපන් දිනය : .....................................
3. ජා:හැ: අංකය : ..................................... 4. ජාතිය : .....................................
5. ආගම : ..................................... 6. ලිපිනය : .....................................
7. දුරකථන අංකය : ..................................... 8. ග්‍රාමසේවා කොට්ඨාශය : .....................................
9. දිස්ත්‍රික්කය : ..................................... 10. අධ්‍යාපන සුදුසුකම් : .....................................
11. වෙනත් සුදුසුකම් : ..................................... 12. ළඟම පොලිසිය : .....................................
13. අනන්‍යතාවය තහවුරු කිරිම සඳහා ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.

දුරකථන අංකය : 011-2855952